සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 12 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු

**General Certificate of Education (Adv. Level), Grade 12, Second Term Test, March 2020**

බෞද්ධ ශිෂ්ටාචාරය - I

**Buddhist Civilization - I**

45 | S | I

පැය 02 යි

**Time: 02 hours**

උපදෙස්

සියලුම ප්‍රශ්නවලට පිළිතුර සපයන්න

- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට 1, 2 ,3 4, 5 යන පිළිතුරු වලින් නිවැරදි පිළිතුර තෝරාගෙන එය උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න

(01) භාරතීය සමාජය තුළ තම ආධිපත්‍යය ගොඩනගා ගැනීම සඳහා බමුණන් විසින් විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත. ඒ අතර ප්‍රබල කරුණක් ලෙස සැලකිය හැක්කේ ,

1 නියති පරිණාමවාදයක් පිළිගැනීමයි. 2 කාන්තා නිදහස අහිමි කිරීමයි. 3 යාගය හඳුන්වාදීමයි.
4 උදක පාරිශුද්ධිය හඳුන්වාදීමයි. 5 ඊශ්වර නිර්මාණවාදය අගය කිරීමයි.

(02) වර්ණ ධර්ම පිළිබඳ බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව වෛශ්‍ය වංශිකයන්ට නොලැබී ගිය කටයුතු වන්නේ.

1 වෙළදාම හා කෘෂිකර්මාන්තය. 2 ඉගෙනීම හා දන් පිළිගැනීම. 3 දන්දීම හා රාජ්‍ය පාලනය.
4 ප්‍රජා සංරක්ෂණය හා යාග කරවීම. 5 යාග කරවීම හා මුදල් පොළියට දීම.

(03) යාගය උසස් ම ආගමික කාර්යයක් සේ සලකන ලද බමුණන් විසින් ඒ සඳහා බ්‍රාහ්මණ පූජකවරුන්ගේ සහභාගි වීම අනිවාර්ය සේ සැලකීය. ඒ අනුව ''අධ්වර්යු'' නමින් හැඳින් වූ පූජකවරයා,

1 යාගයේ අධ්‍යක්ෂවරයා විය 2 යාගය සිදු කරන්නා විය 3 යාගයට ආරාධනා කරන්නා විය
4 වේදපාඨ ගායනා කරන්නා විය 5 යාගය පිළිගනු ලබන්නා විය

(04) ආපද් ධර්ම පිළිබඳ බ්‍රාහ්මණ විග්‍රහය විමර්ශන කිරීමේදී පෙනීයන නිවැරදි අදහසක් වන්නේ,

1 වෛශ්‍යයාට ක්ෂත්‍රියාට අයත් කාර්යයන් කළ හැකිය යන්නයි.
2 බ්‍රාහ්මණයන්ට අයත් වූ කාර්යයන් වෛශ්‍යයාට කළ හැකිය.
3 වෛශ්‍යයාට අයත් කාර්යයන් බමුණාට කළ හැකිය යන්නයි.
4 ශුද්‍රයාට ඕනෑම කාර්යයන් කළ හැකිය යන්නයි.
5 ක්ෂත්‍රියයාට ඉගැන්වීම කළ හැකි බවයි.

(05) බුද්ධ කාලීන භාරතීය සමාජයේ නියති පරිණාමවාදි ඉගැන්වීමක් හඳුන්වා දුන් ශාස්තෘවරයා වූයේ,

1 පූර්ණ කස්සප තුමා 2 මක්ඛලී ගෝසාල තුමා ය. 3 සංජය බෙල්ලට්ඨි පුත්ත තුමා
4 අජිතකේස කම්බලී තුමා ය. 5 පකුධ කච්චායන තුමා ය.

(06) බ්‍රහ්ම මුඛ සංකල්පය සපුරා ප්‍රතික්ෂේප කරන බුදු සමය අවධාරණය කරන්නේ ජන්මය මත නොව පුද්ගල ක්‍රියාකාරකම් පදනම් කරගෙන උසස් පහත් බව තීරණය කළයුතු බවයි. එය තහවුරු  කිරීම සඳහා වඩාත් සුදුසු කරුණු ඇතුළත් වන්නේ,

1 අම්බට්ඨ සූත්‍රයේ ය.
2 වසල සූත්‍රයේ ය.
3 මධුර සූත්‍රයේ ය.
4 අස්සලායන සූත්‍රයේ ය
5 වාසෙට්ඨ සූත්‍රයේ ය.

(07) ආශ්‍රම ධර්ම පිළිබඳ බ්‍රාහ්මණ ඉගැන්වීම් අධ්‍යයනය කිරීමේදී පැහැදිලි වන්නේ ඒ තුළ, අන්තර්ගත  වන්නේ ,

1 බ්‍රහ්ම  සහව්‍යතාවය  පතන බ්‍රාහ්මණ පූජකවරු විසින් අනුගමනය කළ යුතු කාර්යභාරය යි.
2 උපනිෂද් යුගයේදී මුනිවරු විසින් අනුගමනය කළ කාර්යභාරය යි.
3 පුද්ගල ජීවිතය අවධිවලට බෙදා ඒ ඒ අවධිවලදී කළ යුතු වූ කාර්යභාරය යි.
4 පූජකවරුන්ට පමණක් හිමි වූ කාර්යභාරය යි.
5 ශ්‍රමණ චින්තකයන්ට අයත් වූ කාර්යභාරය යි.

(08) බුද්ධ කාලීන භාරතයෙහි විවිධ ශ්‍රමණ කණ්ඩායම් සිටි බවට සාධක ඇත. එම ශ්‍රමණ කණ්ඩායම් අතරින්  බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදායෙහි දැකිය නොහැකි වූ විශේෂ කරුණක් වන්නේ ,

1 අටලෝ දහමින් කම්පා නොවීම හා මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කිරීම.
2 පුද්ගල ස්වාමීත්වය අගය කිරීම.
3 පවිත්‍ර වූ කායික ,වාචසික ,මානසික ක්‍රියා ඇති බව.
4 උපාදානයන්ගෙන් තොරව නිදහස් චින්තයනය අනුව කටයුතු කිරීම.
5 කාමසුඛල්ලිකානුයෝගයෙන් යුතු පිළිවෙත් පිරීම.

(09) පෙර කරන ලද සියලු කර්ම ගෙවා අවසන් කිරීමෙන් හා නව කර්ම නොකිරීම තුළින් දුකින් නිදහස් විය හැකි බව ප්‍රකාශ කළේ ,

1 බුදුරජාණන් වහන්සේ විසිනි.
2 නිගණ්ඨනාථපුත්ත තුමා විසිනි.
3 මක්ඛලී ගෝසාල තුමා විසිනි.
4 බමුණු පූජකවරු විසිනි.
5 පූර්ණ කස්සප තුමා  විසිනි.

(10) සුවිශේෂී  හැකියා අගයමින් බුදුරදුන්  විසින් මෙහෙණින් වහන්සේලාට ද විවිධ තනතුරු ප්‍රදානය කර ඇත. ඒ අනුව දිවැස් ඇති තෙරණිවරුන්  අතර අග්‍ර වූයේ ,

1 නන්දා තෙරණිය යි.
2 භද්දාකාපිලානි තෙරණිය යි.
3 කිසාගෝතමී තෙරණිය යි.
4 සෝණා තෙරණිය යි.
5 සකුලා තෙරණිය යි.

(11) තුන්බිය දුරු කිරීම සඳහා බුදුරජාණන් වහන්සේ විසින් රතන සූත්‍රය දේශනා කළ බව ප්‍රකට කරුණකි. එය සිදු වූයේ ,

1 වජ්ජි රාජ්‍යයේ ය.
2 මගධ රාජ්‍යයේ ය.
3 කෝසල රාජ්‍යයේ ය.
4 අවන්ති රාජ්‍යයේ ය.
5 කාසි රාජ්‍යයේ ය.

(12) බුදුරජාණන් වහන්සේ වැඩිම වස් කාල ගණනක් වැඩ සිටියේ

1 මගධ රාජ්‍යයේ ය.
2 කෝසල රාජ්‍යයේ ය.
3 වජ්ජී රාජ්‍යයේ ය.
4 අවන්ති රාජ්‍යයේ ය.
5 වත්ස රාජ්‍යයේ ය.

(13) ශාස්වත හා අශාස්වත යන අන්තද්වයට නොපැමිණ සුන්දර වූ නිවනට ගිය බැවින් ද , එම නිවනට යහපත් ආකාරයෙන් ගිය බැවින් ද යහපත් වූ වචන කතා කරන බැවින්ද බුදුරජාණන් වහන්සේ .............. නමින් හැඳින්වීමට සුදුසුකම් ලබයි.

1 අරහං 2 සුගත 3 ලෝකවිදූ
4 සම්මා සම්බුද්ධ 5 පුරිසදම්මසාරථී

(14) පිලෝතික පරිබ්‍රාජකයා විසින් බුදුරජාණන් වහන්සේ ගේ ප්‍රඥා මහිමය අති උසස් ලෙසින් අගය කළ ආකාරය .................. සූත්‍රයෙහි සඳහන් වී ඇත.

1 මහාසීහනාද 2 මහා සකුළුදායි 3 චූල්ලහත්ථි පදෝපම
4 සාලෙය්‍යක 5 සාමඤ්ඤඵල

(15) ''බුදුරජාණන් වහන්සේ ලෞකික ආසා නැමති ගිනිගත් නිවෙස තුළ දැවෙන දරුවන් බේරා ගැනීමට මාර්ග යොදන්නා වූත් බේරා ගැනීමෙන් පසු නිර්වාණය නැමැති ආරක්ෂක ස්ථානයට මගපෙන්වන්නා වූත් පියෙකු බඳුයි.'' යනුවෙන් බුදුරජාණන් වහන්සේ පිළිබඳව ඇගයීමක් කළේ,

1 ලක්ෂ්මි නරසු ය. 2 මැක්ස් මුලර් ය. 3 සෝන්ඩර්ස් ය.
4 බර්ට්‍රන්ඩ් රසල් ය. 5 ඇල්බට් අයින්ස්ටයින් ය.

(16) බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ශ්‍රී සද්ධර්මය මනා අවබෝධයෙන් යුක්තව මතක තබාගත් ධම්ම සේනාධිපති තනතුරු හිමි වූයේ ,

1 ආනන්ද තෙරුන් වහන්සේටය. 2 සැරියුත් තෙරුන් වහන්සේටය. 3 මුගලන් තෙරුන් වහන්සේටය.
4 මහා කාශ්‍යප තෙරුන් වහන්සේටය. 5 අනුරුද්ධ තෙරුන් වහන්සේටය.

(17) රූපාවචර ධ්‍යාන සතරම ලබාගත් අනාගාමී උපාසකවරයකු බවට පත් වූයේ,

1 චිත්ත ගෘහපති තුමා ය. 2 නකුල පිතා ය. 3 යසකුල පුතුගේ පියා ය.
4 අනාථ පිණ්ඩික සිටුතුමා ය. 5 බිම්බිසාර රජතුමා ය.

(18) සම්බුදු සසුනෙහි පැවිදිව සිවු පිළිසිඹියා සහිතව රහත් බවට පත් වූයේ,

1 මහා ප්‍රජාපති ගෝතමී තෙරණින් වහන්සේ ය. 2 උප්පලවණ්ණ තෙරණින් වහන්සේ ය.
3 ඛේමා තෙරණින් වහන්සේ ය. 4 ධම්මදින්නා තෙරණින් වහන්සේ ය.
5 භද්දකච්චායනා තෙරණින් වහන්සේ ය.

(19) නිදහස් චින්තනය අගය කළ බුදුරදුන් විසින් ආත්මාර්ථකාමී නොවී ස්වාධීනව ක්‍රියා කිරීමේ වැදගත්කම ආදර්ශයෙන් පෙන්නුම් කර ඇත. ඒ අනුව ඔබ පෙර ජෛන ආගම අදහන විට එම ආගමික පිරිස් සඳහා දානය පූජා කළේ ය. තෙරුන්වන් සරණ ගිය පසුවද පෙර චාරිත්‍ර එසේම කරගෙන යන්න යනුවෙන් දේශනා කළේ,

1 බිම්බිසාර රාජතුමා ඉදිරියේදී ය. 2 පිලෝතික ඉදිරියේදී ය. 3 අභය කුමාරයා ඉදිරියේදී ය.
4 කොසොල් රජතුමා ඉදිරියේදී ය. 5 උපාලි ගෘහපතියා ඉදිරියේදී ය.

(20) ඒ කාන්තයෙන් ම මම තරණය කළෙමි, තරණය කරවන්නට මිදුනෙමි , මුදවන්නට දැමුනෙමි දමනය කරවන්නට ශාන්ත වූයෙමි , ශාන්ත කරවන්නට අස්වැසුනෙමි , අස්වසන්නට පිරිනිවියෙමි , පිරිනිවාලන්නට සමත් වෙමි. ' යි යන ආකල්පය බුදුරජාණන් වහන්සේ තුළ පැවැතියේ ය. එකී ආකල්පයෙන් පැහැදිලි වන්නේ ,

1 බුදුරජාණන් වහන්සේ තුළ පැවති තාදී ගුණය යි.
2 බුදුරජාණන් වහන්සේ තුළ පැවති පද්මාකාර ජීවිතය යි.
3 බුදුරජාණන් වහන්සේ තුළ පැවති මහා කරුණා ගුණය යි.
4 බුදුරජාණන් වහන්සේ තුළ පැවති මහා ප්‍රඥා ගුණය යි.
5 බුදුරජාණන් වහන්සේ තුළ පැවති මාර්ගෝපදේශකත්වය යි.

(21) බුද්ධ කාලීන භාරතීය සමාජයේ ව්‍යාප්තව පැවති ආගමික දෘෂ්ටිවාදි සංඛ්‍යාව වන්නේ,

1 හයකි.
2 දහසයකි.
3 තිස්දෙකකි.
4 හැටකි.
5 හැට දෙකකි.

(22) සමාජ සංස්ථාවන්ගේ ප්‍රභවය හා විකාශ පිළිබඳව විවිධ මතවාද පැවතියේ ය. ඒ අනුව සමාජ ප්‍රභවයත්, පරිණාමයත් සිදු වූයේ පුද්ගලයා විසින් සිය ගැටලුවලට විසඳුම් සෙවීමේ ප්‍රතිඵලයක් නිසා බව අවධාරණය කළේ,

1 හේතුඵලවාදීන් විසිනි.
2 නිර්මාණවාදීන් විසිනි.
3 උච්ඡේදවාදීන් විසිනි.
4 නියතිවාදීන් විසිනි.
5 පුබ්බේකත හේතුවාදීන් විසිනි.

(23) බුද්ධකාලීන භාරතයේ පැවති දේශපාලනික තොරතුරු විමසීමේදි වඩාත් නිවැරදි ප්‍රකාශය විය යුත්තේ,

1 සැවැත්නුවර අගනගරය කරගත් කෝසලය සමූහාණ්ඩුවක් විය.
2 රජගහනුවර අගනගරය වූ මගධ රාජ්‍යයේ ගණතන්ත්‍ර ලක්ෂණ පැවතියේ ය.
3 කොසඹෑ නුවර අගනගරය වූ වත්ස රාජ්‍යයේ රාජාණ්ඩු පාලනයක් පැවතියේ ය.
4 විසාලා මහනුවර අගනගරය වූ වජ්ජි රාජ්‍යයේ ප්‍රබල රාජාණ්ඩු ලක්ෂණ පැවතියේ ය.
5 සාවත්ථිය අගනගරය වූ කෝසලයෙහි බුද්ධකාලීන පාලකයා වූයේ බිම්බිසාර රජු ය.

(24) පුද්ගල හා පරිසරය පිළිබඳව මනා අවබෝධයකින් යුක්ත වූ බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනා කිරීමේ දී විවිධ ක්‍රමවේද අනුගමනය කර ඇත. ඒ අනුව අර්ථය පැහැදිලි කරමින් දහම් දෙසීමේ ක්‍රමය හඳුන්වා ඇත්තේ,

1 අත්තජ්ඣාසය නමිනි.
2 පරජ්ඣාසය නමිනි.
3 අට්ඨුප්පත්තික නමිනි
4 පුච්ඡාවසික නමිනි.
5 ඨපනීය නමිනි.

(25) ආනන්ද මහා තෙරුන් වහන්සේගේ ආචාර්ය වරයාණන් වහන්සේ වූයේ,

1 පුණ්ණමන්තානිපුත්ත තෙරුන් වහන්සේ ය.
2 සැරියුත් තෙරුන් වහන්සේ ය.
3 මුගලන් තෙරුන් වහන්සේ ය.
4 සීවලී තෙරුන් වහන්සේ ය.
5 කොණ්ඩඤ්ඤ තෙරුන් වහන්සේ ය.

(26) බුද්ධ කාලීන භාරතයේ සිටි විවිධපාලකවරු බුදු දහම වැළඳ ගෙන බෞද්ධයන් බවට පත් විය. ඒ අතර මහා කච්චාන තෙරුන් වහන්සේගෙන් ධර්මය ඇසීමෙන් පසු තෙරුවන් සරණ ගිය පාලකයා නම්,

1 බිම්බිසාර රජතුමා ය. 2 අජාසත්ත රජතුමා ය. 3 කොසොල් රජතුමා ය.
4 චණ්ඩප්පජ්ජෝත රජතුමා ය. 5 උදේන රජතුමා ය.

(27) භාරතයෙහි ආර්ය ජනාවාස ආරම්භයට පෙර සිටම කෘෂිකර්මාන්තය ප්‍රබල ජීවන වෘත්තීයක් ලෙස පැවතියේ ය. බුද්ධ කාලයේදී ද එය වඩාත් කැපී පෙනෙන ලක්ෂණයක් වූ නිසාම රාජ්‍ය පාලකයන්ගේ අනුග්‍රහය ද ඒ සඳහා ලැබුණි. එබැවින් කෘෂිකර්මාන්තයේ යෙදෙන ගොවීන් සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබාදිය යුතු බව සඳහන් මූලාශ්‍රයකි.

1 අග්ගඤ්ඤ සූත්‍රය. 2 කාලාම සූත්‍රය. 3 වාසෙට්ඨ සූත්‍රය.
4 මහා මංගල සූත්‍රය. 5 කූටදන්ත සූත්‍රය.

(28) බුදුරජාණ වහන්සේ මාගන්දියා , අක්කෝසක භාරද්වාජ , සුප්පබුද්ධ රජු වැන්නන්ගේ නින්දා අපහාස ඉවසමින් අටලෝ දහමින් කම්පා නොවී කෙලෙස් වලින් ආතුර වූවන් අතර , අනාතුරව වැඩසිටි සේක. මෙම ප්‍රකාශයෙන් කියවෙන්නේ බුදුරජාණන් වහන්සේ සතු වූ ,

1 ඉවසීමේ ගුණය යි. 2 මහා කාරුණික ගුණය යි. 3 පද්මාකාර ජීවිතය යි.
4 අසරණ සරණ ගුණය යි. 5 පරාර්ථකාමී ජීවිතය යි.

(29) උපතිස්ස , කෝලිත යන දෙදෙනා තරුණ වියේ දීම සත්‍ය සොයා ගිය අතර ඒ සඳහා ආසන්න හේතුවක් ලෙස සඳහන් කළ හැකි වන්නේ ,

1 බුදුරජාණන් වහන්සේ පිළිබඳව තොරතුරු දැන ගැනීමයි.
2 ගිරග්ග සමජ්ජ නාට්‍ය සංදර්ශනය නරඹා ඇති වූ කල කිරීමයි.
3 නිවන් අවබෝධ කර ගැනීමේ අරමුණ මූලික වීමයි.
4 දෙමාපියන්ගේ ඉල්ලීමට අවනත වීමයි .
5 අස්සජි මහා රහතන් වහන්සේ පිළිබඳව තොරතුරු දැන ගැනීමයි.

(30) ඈත අතීතයේ දී යෝන සහ කාම්බෝජ ජනපදවල ආර්ය අනාර්ය ලෙස කුල දෙකක් පැවති බව සඳහන් වේ. වරින්වර ආර්යයන් අනාර්යයන් බවටත් අනාර්යයන් ආර්යයන් බවටත් පත් වූ බවද දැක්වේ. ඒ අනුව කුල ක්‍රමය ස්ථිර ඉගැන්වීමක් නොවන බව පෙනේ. මෙකී විස්තරයෙන් පැහැදිලි කරන්නේ,

1 මනෝ විද්‍යාත්මක සාධකය යි. 2 ජීව විද්‍යාත්මක සාධකය යි. 3 දේශපාලන විද්‍යාත්මක සාධකය යි
4 සමාජ විද්‍යාත්මක සාධකය යි. 5 නිතී විද්‍යාත්මක සාධකය යි.

(31) බුද්ධකාලීන භාරතයේ විවිධ ආගමික ඉගැන්වීම් පැවති අතර ඒවායෙහි කාන්තා සමාජයට ස්වාධීනත්වයක් හෝ ඇය පිළිබඳව ධනාත්මක ඇගයීමක් සිදු නොවී ය. නමුත් බුදු දහමින් කාන්තාවන්ට විමුක්තිය ලැබීමට කිසිදු බාධාවක් නොතිබූ බව පැහැදිලි වන්නේ,

1 මහාමායා දේවිය තුසිත දෙව්ලොව උපත ලැබීමෙනි. 2 ථේරී ගාථා වලින් දැක්වෙන උදාන වාක්‍ය තුළිනි.
3 මවට නොසැලකීම පිරිහීමේ කරුණක් ලෙස දැක්වීමෙනි. 4 දෙමාපියන් බ්‍රහ්ම නාමයෙන් හැඳින්වීමෙනි.
5 කාන්තාවන් ද විචාරශීලී වන බව දේශනා කිරීමෙනි.

(32) බුද්ධ කාලීන භාරතයේ විසූ විවිධ ආගමික කණ්ඩායම් විසින් ඉදිරිපත් කරන ලද ඉගැන්වීම් අතුරෙන් පුද්ගල ස්වාධීනත්වය තහවුරු කිරීමට වඩාත් යෝග්‍ය ප්‍රකාශය වන්නේ,

1 ස්වාධීනත්වය ලැබීමට නිශ්චිත යාගහෝම කළයුතු බවයි. 2 නිදහසේ සිතාමතා නිවැරදි ක්‍රියා කළ යුතු බවයි.
3 නිවැරදි අයුරින් ආශ්‍රම ධර්ම සම්පූර්ණ කළ යුතු බවයි. 4 අනිවාර්යයෙන්ම යාගහෝම කළ යුතු බවයි.
5 බ්‍රහ්ම චර්යා පිළිවෙත අනුගමනය කළ යුතු බවයි.

(33) යුක්තිය සාධාරණය අගයන පාලකයකු විසින් නිවැරදි තීරණ ගැනීමේ දී වෙන් විය යුතු යැයි අවධාරණය කර ඇත්තේ,

1 සතර බ්‍රහ්ම විහරණ වලිනි. 2 සතර කර්මක්ලේශ වලිනි. 3 සතර දුෂ්චරිත වලිනි.
4 සතර අගති වලිනි. 5 සතර සංග්‍රහ වස්තු වලිනි.

(34) රටක පාලකයන්ට විවිධ වගකීම් හා යුතුකම් ඉටු කිරීමට සිදු වේ. ඒ අතර දිළිඳු බවෙන් රටේ ජනතාව මුදවාගැනීමත්, ප්‍රජා සුභසාධනය හා ප්‍රජා අවශ්‍යතා සපුරාලීමත් , රටේ සංවර්ධනය ඇති කිරීමත් මූලික වගකීම් ය. ඒවා සපුරාලීම සඳහා රජු සතුවිය යුතු ගුණධර්ම නම් ,

1 දානය යි. 2 සීලය යි. 3 පරිත්‍යාගය යි.
4 ඍජු බවයි. 5 ඉවසීමයි.

(35) සමාජයේ පවතින දුගී භාවය දුරු කිරීම සඳහා පියවර ගැනීමත් , ජනතාවගේ ආරක්ෂාව සහතික කිරීමත් , සමාජයේ සාමය සුරකීම හා අපරාධ මර්දනය කිරීමත් , සිල්වත් මහණ බමුණන්ගේ උපදෙස් ලබා ගැනීමත් යහපාලන ප්‍රතිපත්ති ලෙස දක්වා ඇති දේශපාලන මූලධර්ම හඳුන් වන්නේ,

1 පංචසීලය නමිනි. 2 දසරාජධර්ම නමිනි. 3 සප්ත පරිහාණිය ධර්ම නමිනි.
4 දස සක්විතිවත් නමිනි. 5 සතර සංග්‍රහ වස්තු නමිනි.

(36) සාමකාමීව යුද්ධ වලින් තොරව රාජ්‍යයක් පාලනය කිරීමේ වැදගත්කම බුදු දහම අවධාරණය කරයි. ඒ අනුව නොනසමින් , නොනස්වමින් , නොදිනමින් ,නොදිනවමින් ශෝක නොකරමින් , ශෝක නොකරවමින් දැහැමිව රාජ්‍ය කිරීමට හැකිවේද යන්න කල්පනා කළේ ,

1 කොසොල් රජතුමා ය. 2 බිම්බිසාර රජතුමා ය. 3 මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ය.
4 පජ්ජෝත රජතුමා ය. 5 බුදුරජාණන් වහන්සේ ය.

(37) සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳව බෞද්ධ ආකල්පය පැහැදිලි කරන දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයට අනුව විවිධ හේතු කරන කොටගෙන සමාජ පරිණාමය සිදු වී ඇත. ඒ අනුව දේපල අයිතිය , රාජ්‍ය පාලනය , බදු ක්‍රමය , පවුල් ජීවිතය සංවිධානය ආදි සියල්ල ඇති වූයේ ,

1 නියතිවාදය අනුවයි. 2 කර්මවාදය අනුවයි. 3 නිර්මාණවාදය අනුවයි.
4 හේතුඵලවාදය අනුවයි. 5 ස්වභාවවාදය අනුවයි.

(38) බුදුරජාණන් වහන්සේ සමකාලීන පාලකයන් සමග නිරතුරුව සබඳතා පවත්වා ඇති අතර එහිදී රජවරුන්ට දහම් දෙසීම ද සිදු කර ඇත. ඒ අනුව අජාසත්ත රජතුමා අරභයා ............. සූත්‍රය දේශනා කර ඇත.

1 සාමඤ්ඤඵල සූත්‍රය. 2 බ්‍රහ්මජාල සූත්‍රය. 3 තිරෝකුඩ්ඩ සූත්‍රය.
4 වාසෙට්ඨ සූත්‍රය. 5 කූටදන්ත සූත්‍රය.

(39) සිරිපාල මහාතා සත්‍යවාදි බවේ අගය නිතර තම මිතුරන් සමග ප්‍රකාශ කළේ ය. වසර කිහිපයක් තිස්සේ වෙසක් පොහොය නිමිති කරගෙන මරණයට ගෙනයන ගවයන් මුදවාගෙන ඔවුන්ට අභය දානය දීමේ පිංකමට දායක විය. කිසි දිනක පවුල තුළ අඬදබර ඇතිකර නොගත් ඔහු සමාජයට ආදර්ශමත් වෙමින් අමද්‍යප සංගමයක් ද තම ගම්මානය තුළ ආරම්භ කළේ ය. මෙම ක්‍රියා කලාපය අනුව සිරිපාල මහතා ,

1 සත්‍යගරුක වූ කෙනෙකි. 2 පරෝපකාරය ප්‍රිය කළ බෞද්ධයෙකි. 3 රටේ පවතින නීතිරීතිවලට අවනත වූවෙකි.
4 ගමේ සිටිසිල් ආරක්ෂා කරන්නෙකි. 5 සිවුපා සතුන්ට ආදරය කළ කෙනෙකි.

(40) සමස්ත පෘථිවියේ සියලු ප්‍රාණීන් මරා එකම මස් ගොඩක් බවට පත් කළ ද , එයින් උපදනා පාපයක් නැතැයි ප්‍රකාශ කළේ,

1 නිගණ්ඨනාත පුත්ත තුමා ය. 2 පකුධ කච්චායන තුමා ය. 3 සංජය බෙල්ලට්ඨි පුත්ත තුමා ය.
4 අජිත කේසම්බලි තුමා ය. 5 පූර්ණ කාස්සප තුමා ය.

(41) බමුණු සමාජය තුළ විවිධ ආගමික චාරිත්‍ර විධි පැවතියේ ය. ඒ අතර 'පර්ධා චාරිත්‍රය' හඳුන්වා දී ඇත්තේ,

1 බ්‍රහ්මචාරි ආශ්‍රමයට ප්‍රවේශ වීමට පෙර කරන චාරිත්‍රයක් ලෙසයි.
2 පිරිමි දරුවකු පිළිසිඳ ගැනීම ප්‍රාර්ථනා කරන චාරිත්‍රයක් ලෙසයි.
3 රාජාභිෂේකය සඳහා අනුගමනය කරන චාරිත්‍රයක් ලෙසයි.
4 වැන්දඹු ස්ත්‍රීන් අනුගමනය කරන චාරිත්‍රයක් ලෙසයි.
5 බමුණු පූජකවරයකු විසින් අනුගමනය කරන චාරිත්‍රයක් ලෙසයි.

(42) බුදුරජාණන් වහන්සේ ජීවමාන සමයේ දී ආරණ්‍යවාසි භික්ෂූන් අතුරෙන් අග්‍රස්ථානයට පත් වූයේ,

1 ඛදිරවනීය රේවත මහ රහතන් වහන්සේ ය. 2 සුනාපරන්තවාසී පුණ්ණ තෙරුන් වහන්සේ ය.
3 කාකණ්ඩපුත්ත යස මහරහතන් වහන්සේ ය. 4 සානවාසි සම්භූත මහ රහතන් වහන්සේ ය.
5 මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ය.

(43) නිහඬතාවය ඉතා ඉහළින් අගය කරන ශාස්තෘවරයෙකු ලෙස බුදුරජාණන් වහන්සේ පිළිබඳව තම ශ්‍රාවකයන් ඉදිරියේ ඇගයීමක් කළේ,

1 සෝණදණ්ඩ බමුණා ය. 2 සකුළුදායි පිරිවැජියා ය. 3 සංජය පිරිවැජියා ය.
4 ජෛන මහාවීර තුමා ය. 5 පෝක්ඛරසාතී බමුණා ය.

(44) 'රිය සකට කඩ ඇණය මෙන් ' සමාජයේ යහ පැවැත්මට හේතු වන්නේ ,

1 පංචශීල ප්‍රතිපත්තිය යි. 2 සතර අගති විරතිය යි. 3 සතර සංග්‍රහ වස්තුව යි.
4 චතුරාර්ය සත්‍යය යි. 5 සතර බ්‍රහ්ම විහරණය යි.

(45) ආරම්භ ධාතු , නික්ඛම ධාතු , පරක්කම ධාතු , ථාම ධාතු , ඨිති ධාතු , උපක්කම ධාතු යන ඉගැන්වීම් මගින් අර්ථවත් වන්නේ ,

1 පුද්ගලයා පාලනය කරන වෙනත් බලවේගයක් ඇති බවයි.
2 ක්‍රියාවකට අනිවාර්යය ඵලයක් ඇති බවයි.
3 තමා උපමා කරගෙන ජීවත් විය යුතු බවයි.
4 පුද්ගල ශක්ති හා ස්වාධීනත්වය පුද්ගලයා සතු වන බවයි.
5 කුසල් කිරීමෙන් පාප කර්ම යටපත් කළ හැකි බවයි.

(46) බුද්ධ ශරීරය කොතරම් දුර්වල වුවද උන් වහන්සේගේ ප්‍රඥා ශක්තියෙහි කිසිදු වෙනසක් නොවූ බව පැහැදිලි කෙරෙන්නේ ,

1 මජ්ඣිම නිකායේ උපාලි සූත්‍රයෙනි.
2 මජ්ඣිම නිකායේ අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයෙනි.
3 අංගුත්තර නිකායේ කාලාම සූත්‍රයෙනි.
4 දීඝ නිකායේ සාමඤ්ඤඵල සූත්‍රයෙනි.
5 මජ්ඣිම නිකායේ මහාසීහනාද සූත්‍රයෙනි.

(47) කවර හෝ සැකයක් මට ඇති වූ කල්හි එකෙනෙහිම එය විචාරීමට අවසර ලැබිය යුතු බවට බුදුරජාණන් වහන්සේගෙන් කාරුණික ඉල්ලීමක් කළේ,

1 රාහුල තෙරුන් වහන්සේ ය. 2 කොණ්ඩඤ්ඤ තෙරුන් වහන්සේ ය.
3 ආනන්ද තෙරුන් වහන්සේ ය. 4 සැරියුත් තෙරුන් වහන්සේ ය.
5 මුගලන් තෙරුන් වහන්සේ ය.

(48) අතීතයේ භාරතයේ නාගරිකරණය හා වාණිජකරණය පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීමේදී විවිධ වෙළඳාම් ක්‍රම පිළිබඳව ද තොරතුරු හමු වේ. ඒ අනුව සේරිවානිජ ජාතක කතාවෙන් හෙළිවන්නේ ,

1 මහා පරිමාණයේ වෙළඳාම පැවති බවයි. 2 ගැල් මගින් වෙළඳාම සිදු කළ බවයි.
3 කහවණු භාවිතය බෙහෙවින් සිදු වූ බවයි. 4 කහවණු භාවිතය මෙන්ම භාණ්ඩ හුවමාරුව තිබූ බවයි.
5 පදික වෙළඳාම ජනප්‍රිය වූ බවයි.

(49) බුදුරජාණන් වහන්සේ ප්‍රසංසාවට ලක් වූ පාලන ක්‍රමයක් පැවතියේ,

1 මගධ රාජ්‍යයේ ය. 2 අවන්ති රාජ්‍යයේ ය. 3 කෝසල රාජ්‍යයේ ය.
4 පංචාල රාජ්‍යයේ ය. 5 වජ්ජි රාජ්‍යයේ ය.

(50) ජෛන මහාවීර තුමාගේ අට වැදෑරුම් කර්ම විග්‍රහය තුළ මෝහනීය කර්ම ලෙස හඳුන්වන්නේ ,

1 පුද්ගලයා මුලා කරන කර්මය යි. 2 පුද්ගලයා දියුණු කරන කර්මය යි.
3 ආත්මය කිලිටි කරන කර්මය යි. 4 පුද්ගල අවයව ඇති කරන කර්මය යි.
5 දුක ඇති කරන කර්මය යි.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 12 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු

General Certificate of Education (Adv. Level), Grade 12, Second Term Test, March 2020

**බෞද්ධ ශිෂ්ටාචාරය - II**

**Buddhist Civilization - II**

45 | S | II

පැය 03 යි

**Time: 03 hours**

**අමතර කියවීම් කාලය මිනි : 10 කි**

උපදෙස්

* **I කොටසින්** ප්‍රශ්න දෙකක් ද **II කොටසින්** ප්‍රශ්න තුනක් ද තෝරාගෙන **ප්‍රශ්න පහකට** පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකටම ලකුණු 20කි. (1)(2)(3) ප්‍රශ්නවල එක් කොටසකට ලකුණු 4 බැගින්ද (4)(5)(6)(7)(8) ප්‍රශ්නවල එක් කොටසකට ලකුණු 10 බැගින්ද හිමි වේ.

**I කොටස**

(1) i බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව වෛශ්‍ය වර්ණයට හිමි වූ ස්වධර්ම නම් කරන්න.

ii ආපද් ධර්ම හඳුන්වන්න.

iii වාන ප්‍රස්ථ ආශ්‍රමයට අයත් කාර්යයන් කෙටියෙන් පෙන්වා දෙන්න.

iv පූර්ණ කස්සප ශාස්තෲවරයාගේ අකිරියවාදය ගෙනහැර දක්වන්න.

v අකිරියවාදය පිළිබඳව බුදු සමයේ ආකල්පය කෙටියෙන් ඉදිරිපත් කරන්න.

(2) i ලෝකවිදූ බුදු ගුණය හඳුන්වන්න.

ii පද්මාකාර ජීවිතය කෙටියෙන් විස්තර කරන්න.

iii ප්‍රශ්න විසඳීම සඳහා බුදුරජාණන් වහන්සේ යොදාගත් චතුර්විධ ක්‍රමවේදය හඳුන්වා දෙන්න.

iv අෂ්ට විද්‍යා නම් කරන්න.

iv අනේපිඬු සිටුතුමාගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ කෙටියෙන් දක්වන්න.

(3) i රාජාණ්ඩු පාලනයක විශේෂ ලක්ෂණ හතරක් ගෙනහැර දක්වන්න.

ii කෝසල රාජ්‍ය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

iii දස රාජ ධර්ම නම් කරන්න.

iv සමූහාණ්ඩු පාලන ක්‍රමය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

v බුද්ධ කාලීන පාලකයන් දෙදෙනෙකු බුදුරජාණන් වහන්සේ සමග පැවති සබඳතා ගෙනහැර දක්වන්න.

## II කොටස

(4) i කාන්තාව පිළිබඳ බ්‍රහ්මණ සමාජයේ පැවති ආකල්ප නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

ii කාන්තාවට ගෘහස්ථ ජීවිතය අභිමානවත් ලෙස ගත කිරීමට අවශ්‍ය පසුබිම බුදු දහමින් සකස් කර ඇති ආකාරය පැහැදිලි කරන්න.

(5) i බුද්ධ කාලීන භාරතයේ පැවති වෙළෙඳ ආර්ථිකය පිළිබඳ විමසීමක් කරන්න.

ii වාණිජ ක්ෂේත්‍රයේ දියුණුව බුදු සසුනේ උන්නතිය සඳහා හේතු වූයේ දැයි පරීක්ෂා කරන්න.

(6) i බ්‍රාහ්මණයන් තම අධිපත්‍ය ගොඩ නගාගැනීම සඳහා ස්ව ධර්ම සංකල්පය හා ආපද් ධර්මය යොදා ගත් ආකාරය විමර්ශනය කරන්න.

ii බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව ශුද්‍රයන්ගේ අයිතිවාසිකම් අහිමි වූ ආකාරය විස්තර කරන්න.

(7) i යහපත් රාජ්‍ය පාලන ප්‍රතිපත්තියක් ලෙස සප්ත අපරිහානි ධර්ම වල උපයෝගීතාවය විමර්ශනය කරන්න.

ii පාලක පාලිත දෙපක්ෂයම පන්සිල් සුරැකීමෙන් සාමය සමෘද්ධිය උදාවන ආකාරය පැහැදිලි කරන්න.

(8) i පුද්ගල ස්වාමිත්වයට ස්වාධීනත්වයට හා ස්වච්ඡන්දතාවයට බාධා පැමිණ වූ ආගමික ඉගැන්වීම් විමසුමට ලක් කරන්න.

ii බුදු සමයෙන් පුද්ගල ස්වාමිත්වය හා ස්වාධීනත්වය අගය කළ ආකාරය විස්තර කරන්න.